Alcohol and Drug
Information Centre

ADIC

No.40/18, Park Road, Colombo 5, Sri Lanka.
Tel: +94 11 2584416, +94 11 2592515, Fax: +94 11 2508484
E-mail: info@adicsrilanka.org, adicc@sltnet.lk
Web Site: http://www.adicsrilanka.org

**මාධ්‍ය නිවේදනය**

**2023 පෙබරවාරි 13**

**වෛද්‍යවරුන්, විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්, ආචාර්යවරුන්, ඉංජිනේරුවන්, බැංකුකරුවන් සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඉහළ විධායක නිලධාරීන් ඇතුළු ජනතාව මුහුණ දෙමින් සිටින ආර්ථික පීඩනය පාලනය කිරීමට සිගරට් බදුකරණය නිවැරදි කරනු.**

පසුගිය සමයේ විවිධ ප්‍රතිපත්ති, තීරණ සහ වෙනත් හේතුමත රජයට අහිමිව ගිය ආදායම නැවත ලබාගැනීමටත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි සපුරාලීමටත් රජය විසින් නව ආදායම් බදු පනතක් ක්‍රියාත්මක කර එමගින් ආදායම් බදු ඉහළ දැමීමට කටයුතු කර ඇත.

මෙම ආදායම් බදු ඉහළ දැමීම නිසා විශේෂයෙන් වෛද්‍යවරුන්, විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්, ආචාර්යවරුන්, ඉංජිනේරුවන්, බැංකුකරුවන් සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඉහළ විධායක නිළධාරීන් ඇතුළු වෘත්තිකයන් ඒ පිළිබඳව සිය අප්‍රසාදය සහ විරෝධතාවය ඉදිරිපත් කර තිබුණි. මෙම තත්ත්වය වෘත්තිකයන්ට කොතරම් බලපෑම් සිදුකර ඇත්ද යන්න ඔවුන් "රට අතහැර යනවා" යන ප්‍රකාශ මගින්ද සනාථ වේ. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඉහළ විධායක නිළධාරීන් ඇතුළු සිය ගණනක් වෘත්තිකයන් තම වෘත්තීය සමිති සහ සංගම් සමඟ ආදායම් බදු වැඩිවීමට එරෙහිව වීදි බැස විරෝධතාවන්හි නිරත වීමද දක්නට ලැබේ.

මෙම බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් බලාපොරොත්තු වන්නේ රජයේ ආදායම ඉහළ නැංවීමටය. නමුත් සමස්තයක් වශයෙන් මෙම තීරණය රජය අපහසුතාවයට පත්වීමටත්, ජනතාවගේ අප්‍රසාදයට ලක්වීමටත් හේතුවී ඇත.

සිගරට් බදු අයකිරීමට විද්‍යාත්මක බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවීම නිසා මෙම වසර තුළද රජයට ලබා ගත හැකිව තිබූ රුපියල් බිලියන 50 කට ආසන්න මුදලක් රජය අහිමි කරගන්නා බව අධ්‍යාන වලින් සනාථ වී ඇත. තවද මෙවර පළාත් පාලන මැතිවරණය කල් දැමීමට රජය උත්සාහ කරන්නේ රජයට ඒ සඳහා මුදල් නොමැති බව පවසමිනි. පළාත් පාලන මැතිවරණය සඳහා වියදම් ඇස්තමේන්තුව රුපියල් බිලියන 10 කි. සිගරට් බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර නියමාකාරව රජය බදු අය කරීමක් සිදු කළානම් රජයට කිසිදු අපහසුතාවයකින් තොරව මැතිවරණ 5 ක් පැවැත්වීමට අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගත හැකිව තිබුණි.

සිගරට් මත විද්‍යාත්මක බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළා නම් මෙම ආදායම් බදු වැඩිකිරීමේ ප්‍රමාණය අවම කරගනිමින් රජය බලාපොරොත්තුවන ආදායම ඉහළ නැංවීමට ද හැකියාවක් තිබුණි. සිගරට් බදු වැඩිවීම

ජනතාව පීඩනයට පත් නොවන ක්‍රියාමාර්ගයකි. ජනතාව සහ ආණ්ඩුව අපහසුතාවයට පත්වන මෙම බදු ප්‍රතිපත්තියට වෙනුවට, මුදල් අමාත්‍යාංශයේ උපදේශකවරුන්ගේ සහ ඉහළ නිළධාරින්ගේ ප්‍රමුඛ කාර්යය විය යුත්තේ මහජනතාව ආරක්ෂා කරගනිමින් රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමයි.

නමුත් මුදල් අමාත්‍යාංශයේ ඉහළ නිළධාරීන් සහ උපදේශකයන් පසුගිය වසර කිහිපයේම සිට සිදුකර ඇත්තේ දුම්වැටි සමාගම්වලින් රජයට ලැබිය යුතු අති විශාල බදු ප්‍රමාණය රජයට අහිමි කිරීමින් ලංකා දුම්කොළ සමාගම (CTC) නමින් පෙනීසිටින, කොටස් අයිතියෙන් 84% බ්‍රිතාන්‍ය ඇමරිකානු දුම්කොළ සමාගමට (BAT) අයත් බහුජාතික සමාගම්වල අරමුණු ඉටුකිරීමයි.

මෙලෙස රටට අහිමිකරමින් තිබෙන අතිවිශාල බදු මුදල් අයකරගෙන වෛද්‍යවරුන්, විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්, ආචාර්යවරුන්, ඉංජිනේරුවන්, බැංකුකරුවන් සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඉහළ විධායක නිලධාරීන් ඇතුළු ජනතාව මුහුණ දෙමින් සිටින ආර්ථික පීඩනය පාලනය කිරීමට මුදල් අමාත්‍යාංශය වහා කටයුතු කළ යුතුව ඇති බව මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය අවධාරණය කර සිටිමු.

මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය